**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14**

**2017 අප්‍රේල් - ජූනි**

**සමාජීයවිද්‍යා පීඨය**

**ජනසන්නිවේදනය - MACO – E 2025**

**සංවර්ධනය, ජනමාධ්‍ය භාවිතය, ආයතන හා සංවිධාන**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. 'සංවර්ධනය යනු මානව සමාජය ලබන තිරසර පැවැත්ම තහවුරු කරන්නකි.'

i. සංවර්ධනය යන්න කෙටියෙන් හඳුන්වා සංවර්ධනයේ අරමුණු මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 10)

ii. සංවර්ධන ප්‍රවේශ මත පදනම් වූ සංවර්ධන ආකෘති හතරක් (04) හඳුන්වා දෙන්න. (ලකුණු 10)

02. 'සංවර්ධන ක්ෂේත්‍රය හා සම්බන්ධ එකිනෙක පාර්ශව අතර අවබෝධය හා විශ්වසනීයත්වය ඉක්මවූ සුවිශේෂී බලපෑමක් ඇති කිරීම සංවර්ධන සන්නිවේදනයේ අරමුණකි.'

i. සංවර්ධනයේදී සන්නිවේදනයේ තිබෙන වැදගත්කම සන්නිවේදනය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. සංවර්ධන සන්නිවේදනය පිළිබඳ වන මූලික අධ්‍යයන හා පර්යේෂණයන් හි ප්‍රතිඵල විල්බර්, ශ්‍රාම්, ඩැනියල් ලර්නර්, රොජර්ස්, හා ඉතියෙල් ද සෝලා පූල් යන අයගේ අධ්‍යයන ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 10)

03. 'සංවර්ධන සන්නිවේදනය වඩාත් නිර්මාණාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන විෂය ක්ෂේත්‍රයකි.'

i. සංවර්ධන සන්නිවේදන ප්‍රචාරණ වැඩසටහන් ප්‍රභේද තුනක් (03) හඳුන්වා දෙන්න. (ලකුණු 10)

ii. ඉහත සඳහන් ප්‍රචාරණ වැඩසටහන් ප්‍රභේද එකක් තෝරා ගෙන උචිත සංවර්ධන ගැටලුවක් ආමන්ත්‍රණයෙහිලා අවශ්‍ය ප්‍රායෝගික සන්නිවේදන වැඩසටහනක් සකස් කිරීමේ මූලික නිර්නායක පෙන්වා දෙන්න. (ලකුණු 10)

04. 'සංවර්ධන සන්නිවේදනය යනු කලාවක් මෙන්ම විද්‍යාවකි.'

i. සංවර්ධන සන්නිවේදන වැඩසටහන් සකස් කිරීමෙහිලා සංවර්ධන පර්යේෂණයන්හි උපයෝගිතාව පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. සංවර්ධන ව්‍යාපෘතියක මූලික අංගෝපාංග උදාහරණයක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 10)

05. 'නූතන සංවර්ධන විෂය ක්ෂේත්‍රය ජාතික හා ජාත්‍යන්තර සංවිධාන ඔස්සේ ක්‍රියාත්මක වීම කැපී පෙනේ.'

i. ඔබ තෝරාගත් ස්වදේශීය (ලාංකීය) සංවර්ධන ආයතනයක මුඛ්‍ය අරමුණු, ව්‍යුහය හා කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 10)

ii. ජාත්‍යන්තර සංවර්ධන ආයතන හතරක් (04) තෝරා ගෙන ඒවා සංවර්ධනය වන රටවලට දක්වන බලපෑම පිළිබඳ විග්‍රහයක් කරන්න.

(ලකුණු 10)

06. 'තොරතුරු සන්නිවේදන තාක්ෂණ මෙවලම්වල වැඩි දියුණුවීම නූතන සංවර්ධන විෂය ක්ෂේත්‍රය තුල කැපී පෙනෙන වෙනසක් ඇති කිරීමට හේතු වී තිබේ.'

i. සංවර්ධනයේදී නව තොරතුරු තාක්ෂණය හා සන්නිවේදන පද්ධති දක්වන වැදගත්කම ආසියානු කලාපයේ රටවල් පදනම් කරගෙන පෙන්වා දෙන්න. (ලකුණු 10)

ii. 'බලගැන්වීම සංවර්ධන සන්නිවේදනයේ ප්‍රමුඛ කාර්යයකි.'

සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම ඇසුරින් දක්වන්න. (ලකුණු 10)

07. 'ලාංකේය ජනමාධ්‍යයේ සංවර්ධන සන්නිවේදන කාර්යභාරය ගිලිහී තිබේ.'

i. ශ්‍රී ලාංකේය මාධ්‍යයේ සංවර්ධන සන්නිවේදන කාර්යභාරය පිළිබඳ සාකච්ඡාවක් කරන්න. (ලකුණු 10)

ii. 'ප්‍රජා මාධ්‍යය' යන්න පුළුල්ව හඳුන්වා ප්‍රජා සංවර්ධනයේ දී ගුවන්විදුලියෙහි කාර්යභාරය උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10)

08. **එක්කෝ**

i. ලාංකේය සංවර්ධන විෂය ක්ෂේත්‍රය ප්‍රායෝගිකව කෙටි කාලීන හා දිගු කාලීන වශයෙන් අත්පත් කරගෙන තිබෙන තත්ත්වයන් මොනවාද? විස්තරයක් කරන්න.

(ලකුණු 20)

**නැත්නම්**

ii. පහත සඳහන් මාතෘකා **හතරක්** පිළිබඳ කෙටි සටහන් සපයන්න.

1. සමාජීය අලෙවිකරණය
2. ගෝලීයකරණය හා සමාජීය වෙනස්වීම
3. සහභාගීත්ව ග්‍රමීය ප්‍රජා සංවර්ධනය
4. සංවර්ධන සහායක සන්නිවේදනය
5. ඩිජිටල් බෙදුම සහ පශ්චාත් යටත්විජිතවාදය.

(ලකුණු 20)

*********************